# රැකියාලාභීන්ගේ ලේඛන ඉදිරිපත් කිරීම සඳහා උපදෙස්

1 පොලිස් වාර්තාව (උපදෙස් සඳහා )

02 විදේශ ගමන් බලපත්‍රයෙහි ඡායාරූපය සහිත පිටුවෙහි (BIO Page) වර්ණ ඡායා පිටපත් 4 ක් රැගෙන ආ යුතුය. ඔබගේ ගමන් බලපත්‍රයෙහි පැරණි ජාතික හැඳුනුම්පත් අංකය සඳහන්ව තිබිය දී ඔබ විසින් නව ජාතික හැඳුනුම්පතක් ලබා ගෙන ඇත්නම් එම නව ජාතික හැඳුනුම්පත් අංකය ගමන් බලපත්‍රයට ඇතුලත් කල යුතුය. එසේ වෙනස් කිරීමක් සිදුකර ඇත්නම් හැඳුනුම්පත් අංකය සඳහන් කර ඇති පිටුවේ වර්ණ ඡායා පිටපත් 4 ක් රැගෙන ආ යුතුය. (පැරණි ගමන් බලපත්‍රයෙහි නම් පිටු අංක 2/3 සහ පිටු අංක 4/5 A4 කොලයෙහි එක් පැත්තක ලබාගත යුතු අතර නව ගමන් බලපත්‍රයක් නම් පිටු අංක 2 සහ 3 එක් A4 පිටුවකට ලබාගත යුතුය.)

03 ජාතික හැඳුනුම්පතෙහි වර්ණ ඡායා පිටපත් 01ක්.

ජාතික හැඳුනුම්පත සිංහල භාෂාවෙන් පමණක් නිකුත් කර ඇත්නම් දෙපැත්තම එක පිටුවකට ගෙන එය දිවුරුම් දුන් භාෂා පරිවර්තකයකු (Sworn Translator) විසින් ඉංග්‍රීසි භාෂාවට පරිවර්ථනය කර වර්ණ ඡායා පිටපතක් රැගෙන ආ යුතුය. භාෂා තුනෙන්ම නිකුත් කරන ලද නව ජාතික හැඳුනුම්පතක් නම් ඉංග්‍රීසි පරිවර්ථනය අවශ්‍ය නොවේ.

04 ඔබගේ ගමන් බලපත්‍රයෙහි සහ ජාතික හැඳුනුම්පතෙහි ඉංග්‍රීසියෙන් සඳහන් වන නම්වල යම් වෙනසක් පවතින්නේ නම් එයට හේතුව සඳහන් කර දිවුරුම් ප්‍රකාශයක් ඉංග්‍රීසි භාෂාවෙන් **(Affidavit)** ඉදිරිපත් කල යුතුය.

05 සුදු පසුබිම සහිත වර්ණ ඡායා රූප 03 ක් (Passport Size).

**සැ. යු.**

i ළා පැහැති ඇඳුමින් සැරසී ඡායාරූප ලබා නොගත යුතුය.

Ii සුදු පසුබිම off white ලෙස දර්ශනය නොවන ආකාරයට තිබිය යුතුය.